ඇසොල්ලා

ශ්‍රී ලංකාවේ ගොවිපල සතුන් සඳහා අඩු වියදමකින් වගා කළ හැකි ගුණාත්මයෙන් ඉහළ අතිරේක ආහාර වර්ගයක්

ප්‍රකාශනය

මානව සම්පත් සංවර්ධන අංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ගැටඹේ - පේරාදෙණිය

පෙරවදන

සත්ත්ව පාලනය ව්‍යාපාරයක් ලෙස කරන ගොවීන්ට සත්ත්ව ආහාර සඳහා වැඩි මුදලක් වැය කිරීමට සිදුවීම නිසා ඔවුන්ගේ නිෂ්පාදන වියදම අධික වී ඇත. ප්‍රෝටීන අධික අතිරේක සත්ත්ව ආහාරයක් ලෙස ඇසොල්ලා යොදා ගැනීමෙන් ගොවිපොල සතුන්ගේ පෝෂණය වැඩි කළ හැකි අතර, නිෂ්පාදන වියදම ද අවම කර ගත හැකිය. ඇසොල්ලා පහසුවෙන් වගා කළ හැකි අතර එය සීඝ්‍ර වර්ධන වේගයක් පෙන්වයි. තවද ඇසොල්ලා පත්‍රවල ඇති කුහර තුළ සහජීවනයෙන් ජීවත්වෙන නිල හරිත ඇල්ගාවක් මගින් වායුගෝලීය නයිට්‍රජන් තිර කරමින් ඇසොල්ලා පැළෑටියට පෝෂණය ලබාදීම විශේෂත්වයක් ලෙස දැක්විය හැකිය. අගනා සත්ත්ව ආහාරයක් ලෙස ඇසොල්ලා වැදගත්කමක් ඉසුළුව ද, ගොවීන් අතර එය සෙමින් ජනප්‍රිය වීමට හේතු වී ඇත්තේ එම වගාව පිළිබඳව ගොවීන් දැනුවත් නොවී සිටීම බව මාගේ බලවත් විශ්වාසයයි.

එවැනි වකවානුවක ඇසොල්ලා වගාව පිළිබඳව අත් පොතක් ලිහිල් බසින් ලිවීම පිළිබඳව පශු වෛද්‍ය පර්යේෂණාතනයේ ගොවිපල් පද්ධති අංශයේ පර්යේෂණ නිලධාරිණී අයි.කේ. ලෙව්කේ බණ්ඩාර මියට බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. මෙම අත්පොතෙහි ඇති කරුණු පරිහරණය කිරීමෙන් සත්ත්ව පාලනයේ නිරත ගොවීන්ගේ සත්ත්ව නිෂ්පාදනය වැඩි වීමත් එහි නිෂ්පාදන වියදම අඩු වීමත් නිසා ආදායම් තත්වය වැඩි වනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ඩී.එම්. භාෂිණි මැණිකේ දිසානායක,
අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන),
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ,
පේරාදෙණිය.

2020 ජනවාරි මස 06 දින

පටුන

	පිටුව
ඇසොල්ලා යනු මොනවාද ?	01
වගා කරන්නේ කෙසේද ?	01
සත්ත්ව ආහාර ලෙස ලබාදෙන ආකාරය	04
පෝෂණ සංයුතිය	05
ඇසොල්ලා පොකුණ නඩත්තු කිරීම	05
විද්‍යාත්මක පසුබිම	07
නිෂ්පාදන වියදම ගණනය කිරීම	07
වැදගත් තොරතුරු	08
විශේෂ පණිවිඩය	09

ඇසොල්ලා යනු මොනවාද ?

ඇසොල්ලා (1 වන රූප සටහන) යනු වේගයෙන් වැඩෙන, නිදහසේ ජලයේ පාවෙන මීවන වර්ගයට අයත් ඉතා කුඩා ජලජ පැළෑටියකි. එහි මුල් ජලයේ පහළට එල්ලී පවතී. මෙම ජලජ පැළෑටිය, පසෙහි පෝෂණය වැඩි කිරීම සඳහා වී වගාවේදී ද යොදා ගන්නා අතර මෙය ජෛව පොහොර වර්ගයක් මෙන්ම අගනා සත්ත්ව ආහාර වර්ගයක් ද වේ. ඉහත සඳහන් කරුණු පෙරදැරි කරගෙන ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල ඇසොල්ලා වගා කිරීම සිදුකරයි. වෙනත් සත්ත්ව ආහාර වර්ග හා සසඳා බලන කල ඇසොල්ලා යනු ගොවිපළ සතුන්ට ලබා දිය හැකි පෝෂණ ගුණයෙන් ඉහළ, වියදම් අඩු අතිරේක ආහාරයක් ලෙස හඳුන්වා දිය හැකිය.

01 වන රූප සටහන

සාමාන්‍යයෙන් ඇසොල්ලා පැළෑටියේ වර්ධනය සඳහා 25% - 50% ක් පමණ හිරු එළිය අවශ්‍ය වන අතර ප්‍රශස්ත උෂ්ණත්වය සෙල්සියස් අංශක 25 ක් පමණ වේ. එළගවයන්, මී ගවයන්, එළුවන්, ඌරන්, කුකුළන්, තාරාවන්, හාවුන් සහ අනෙකුත් ගොවිපළ සතුන්ගේ අතිරේක ආහාරයක් ලෙස ඇසොල්ලා යොදා ගත හැකිය.

වගා කරන්නේ කෙසේද ?

ජලය රඳා පවතින සේ පොළොව හාරා සකස් කර ගන්නා ලද නොගැඹුරු වළවල්, සිමෙන්තියෙන් සාදන ලද ටැංකි (02 වන රූප සටහන, 03 වන රූප සටහන) හෝ වෙනයම් ජලය රඳා සිටින බඳුනක ඇසොල්ලා වගා කළ හැකිය. මේ සඳහා පොළොවෙහි මීටර් 2 x 1 x 0.3 දිග, පළල සහ ගැඹුරින් යුතු වළක් සකසා ගැනීම යෝග්‍ය වේ. මෙම ප්‍රමාණයේ පොකුණකින් දිනකට ඇසොල්ලා කි.ග්‍රෑ. 01 ක් පමණ නිපදවා ගත හැකිය. ගොවි මහතාගේ අවශ්‍යතාවය අනුව වළෙහි විශාලත්වය වෙනස් කර ගත හැකිය. දිනකට කොපමණ ඇසොල්ලා ප්‍රමාණයක් සතුන්ට ආහාරයට දීම සඳහා අදහස් කරන්නේද යන්න මත පොකුණේ ප්‍රමාණය හෝ අවශ්‍ය වන පොකුණු සංඛ්‍යාව වෙනස් කළ යුතුය. ඇසොල්ලා වගා කිරීමට මේ ආකාරයට පොළෙවහි සකස් කර ගත් වළ හොඳින් පිරිසිදු කර මනාව මට්ටම් කරගත යුතුය. ඉන්පසු කල් පවත්නා

02 වන රූප සටහන

03 වන රූප සටහන

ඝනකම් පොලිතින් ඇතිරිල්ලක් වළෙහි පතුලට සහ බිත්තිවලට යොදා ගත යුතුය (04 වන රූප සටහන). මෙසේ යොදා ගන්නා පොලිතින් ආවරණය එහා මෙහා නොවීම සඳහා වළෙහි බිත්තිවලට ගඩොල්, ගල් හෝ ලී කොටන් වැනි බරක් තබා හොඳින් තද කර ගත යුතුය (04 සහ 05 වන රූප සටහන). පසුව හොඳින් හලා පිරිසිදු කරගත් සාරවත් පස් කි.ග්‍රෑ. 10-15 පමණ ඒකාකාරීව වළ තුළ අතුරාගත යුතුය (04 වන රූප සටහන).

04 වන රූප සටහන

05 වන රූප සටහන

ඉන්පසු, දින පහක් පමණ පරණ වූ ගොම කි.ග්‍රෑ. 2-3 ක් පමණ ජලය ලීටර් 10 ක් සමඟ එක්කර සාදා ගත් දියර මිශ්‍රණය වළ තුළ අතුරා අවම වශයෙන් සෙ.මී. 12-15 පමණ ගැඹුරට පිරිසිදු ජලයෙන් වළ පුරවාගත යුතුය (05 වන රූප සටහන). ඇසොල්ලා වගාව නිරෝගීව වර්ධනය වීම සඳහා මෙම පොකුණට කුඩු කරනලද සුපර් පොස්පේට් හෝ රොක් පොස්පේට් ග්‍රෑ. 10-15 පමණ එකතු කළ යුතුය. මෙසේ සකස් කර ගන්නා වළ දින 2-3 ක් පමණ පරණ වීමට ඉඩ හැරිය යුතුය.

ඉහත සඳහන් ආකාරයට සකස් කරගත් ජල පොකුණකට බීජ ඇසොල්ලා පැළ කි.ග්‍රෑ. 01 ක් පමණ මතුපිටින් විසුරුවා හැරිය යුතුය. පොකුණට ඇසොල්ලා එක් කිරීමේ දී වර්ධන වේගය සහ ගුණනය වැඩි කිරීම සඳහා ඇසොල්ලා පැළ කුඩා කැබලි වලට කැඩෙන ආකාරයට මෘදුව අතින් ඇතිල්ලිය යුතුය (06 වන රූප සටහන).

06 වන රූප සටහන

ජල පොකුණට එක්කළ ඇසොල්ලා පැළ කෙලින් අතට සිටීම සඳහා ඇසොල්ලා පැළ එක් කළ විගසම ඇසොල්ලා පැළ මතට පිරිසිදු ජලය විසුරුවා හැරීම කළ යුතුය. මදුරුවන් බෝවීම වැළැක්වීම පිණිසත්, ශාක පත්‍ර සහ වෙනත් කුණු රොඩු පොකුණ තුළට වැටීම වැළැක්වීම සඳහාත් පොකුණ මතුපිට දැලකින් මනාව ආවරණය කළ යුතුය. මීට අමතරව, ඇසොල්ලා වගාවට අවශ්‍ය වන සෙවණ ලබා ගැනීමට ද මෙම දැල උපකාරී වේ. දැල ආරක්ෂා කර ගැනීම සඳහා දැව දඬු හෝ උණ බට පොකුණට උඩින් රැඳවිය යුතුය (07 වන රූප සටහන).

07 වන රූප සටහන

08 වන රූප සටහන

ඉන්පසු දැල දමා, එය එහා මෙහා නොවන පරිදි ඊට උඩින් බර තැබිය යුතුය. (08 වන රූප සටහන). පොකුණට ඇසොල්ලා පැළෑටි එකතු කර දින 10-15 ක් පමණ ගත වූ පසු ප්‍රශස්ත පරිසර තත්ත්ව සහ පාලන තත්ත්ව යටතේ දිනකට කි.ග්‍රෑ. 1-1.5 ක් පමණ ඇසොල්ලා අස්වැන්නක් දිනපතා ලබා ගත හැකිය.

දින 15ක් ඇතුලත පොකුණ තුල ඇසොල්ලා ඝනත්වය වැඩිවන ආකාරය 09, 10 සහ 11 රූප සටහන් වලින් දැක්වේ.

09 වන රූප සටහන

10 වන රූප සටහන



11 වන රූප සටහන

සත්ත්ව ආහාර ලෙස ලබාදෙන ආකාරය:

ඇසොල්ලා අස්වැන්න නෙලා ගැනීමට ප්ලාස්ටික් හෝ ඇලුමිනියම් පෙනේරයක් යොදා ගත හැකිය (12 වන රූප සටහන). සතුන්ට ඇසොල්ලා ආහාරයට දීමට පෙර පොකුණ තුළ ඇති ජලයේ තිබූ ගොමවල දුර්ගන්ධය ඉවත් කිරීම සඳහා ඇසොල්ලා හොඳින් සෝදා පිරිසිදු කරගත යුතුය (13 වන රූප සටහන). මෙසේ පිරිසිදු කරගත් ඇසොල්ලා සහල් නිවුඩු සමඟ හෝ වෙළඳපළෙන් මිල දී ගන්නා වෙනත් සත්ත්ව ආහාර සමඟ හෝ, පිදුරු හෝ වියලි තෘණ ආකාරයෙන් සංරක්ෂණය කරන ලද තෘණ සමඟ මිශ්‍රකර හෝ තනිකර ඇසොල්ලා පමණක් සතුන්ට ආහාර ලෙස ලබාදිය හැකිය. ගවයෙකුට දිනකට කි.ග්‍රෑ. 1.5 - 2.0 ක පමණ ප්‍රමාණයක් ද, එළුවෙකුට දිනකට ග්‍රෑ. 400-500 ක් පමණ ප්‍රමාණයක් ද, කිකිළියකුට දිනකට ග්‍රෑ. 75-100 පමණ ප්‍රමාණයක් ද අනෙක් සත්ත්ව ආහාර සමඟ ආහාරයට ලබා දිය හැකිය (14 වන රූප සටහන).

12 වන රූප සටහන

13 වන රූප සටහන

14 වන රූප සටහන

පෝෂණ සංයුතිය:

වියළි ද්‍රව්‍ය	- 5-7%	
දළ ප්‍රෝටීන්	- 20-30%	(වියළි ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතයක් ලෙස)
ඊතර් නිස්සාරණය	- 4-5%	(වියළි ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතයක් ලෙස)
දළ තන්තු	- 14-16 %	(වියළි ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතයක් ලෙස)
සමස්ත අළු ප්‍රමාණය	- 15-18 %	(වියළි ද්‍රව්‍යවල බරෙහි ප්‍රතිශතයක් ලෙස)

ඇසොල්ලා පොකුණ නඩත්තු කිරීම:

- පොකුණ තුළට පොලිතින් ඇතිරිල්ල එළීමේදී එයට හානියක් නොවීමට වගබලා ගත යුතුය.
- පොකුණේ ජලය කාන්දු වී එළියට යෑම වැළැක්වෙන ලෙස හොඳින් පොලිතින් ආවරණය දැමිය යුතුය.
- පොකුණ තුළ නයිට්‍රජන් එකතු වීම වැළැක්වීම සඳහා දින 10-15 කට පමණ වරක් ඇසොල්ලා පොකුණේ පරණ ජලය ඉවත් කර අළුත් ජලය පිරවිය යුතුය.
- ඇසොල්ලා පැළෑටියේ මුල පොළවට සවි වීමට ඉඩ නොදී ජලයේ පාවීමට ඉඩ සැලසෙන ආකාරයට අවම වශයෙන් සෙ.මී 10 ක් ගැඹුරට ජල මට්ටම රඳවා තබා ගත යුතුය. මේ මඟින් අස්වැන්න නෙලා ගැනීමට පහසු වන අතර, මඩ සහ පස්වලින් තොර, සතුන්ගේ ආහාර රුචිකත්වයට හානියක් නොවන ආකාරයේ පිරිසිදු ඇසොල්ලා අස්වැන්නක් ලබාගත හැකිය. පොකුණ තුළ නියමිත ජල මට්ටම නොමැතිවීම නිසා මඩ සහ පස් සහිතව සතුන්ට ආහාරයට දීමට නුසුදුසු ආකාරයට වැවුණු ඇසොල්ලා සාම්පලයක් 15 වන රූප සටහනින් දැකගත හැකිය.

15 වන රූප සටහන

- වඩා හොඳ/නිරෝගී වර්ධනයක් සඳහා සති 2 කට වරක්, දින 04-05 ක් පමණ පරණ වූ ගොම කි.ග්‍රෑ. 01 ක් සහ සුපර් ෆොස්ෆේට් හෝ රොක් ෆොස්ෆේට් ග්‍රෑ. 30 ක්, මීටර් 2 x 1 x 0.3 දිග, පළල සහ ගැඹුරින් යුතු පොකුණකට යෙදිය යුතුය.
- ඇසොල්ලා වගාවට සකසාගත් පොකුණ මාස 6-8 කට වරක් හිස් කර අළුත් පස් මිශ්‍රණයක්, අළුත් ගොම දියර මිශ්‍රණයක් සහ අළුත් ඇසොල්ලා රෝපණයක් ද ජලය ද අළුතෙන් යොදා නැවත අළුත් වගාවක් ලෙස ආරම්භ කළ යුතුය.
- අධික වර්ෂාව පවතින දිනවල දී පොකුණේ ජලය පිටාර ගැලීම පාලනය කර ඇසොල්ලා වගාව ආරක්‍ෂා කරගැනීම සඳහා පියවර ගත යුතුය. ජලය පිටාර ගැලීම පාලනය කිරීම සඳහා පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ගොවිපල් පද්ධති අංශය මඟින් සකස් කරන ලද ප්ලාස්ටික් බට කැබැල්ලක් සහ කුඩා දැල් කැබැල්ලක් යොදා සකස් කරගත් කුඩා උපකරණයක් මෙහි දක්වා ඇත (16 වන රූප සටහන).

16 වන රූප සටහන

- පොකුණ තුළ ඇසොල්ලා වගාව අධිකව වර්ධනය වීම වැළැක්වීම සඳහා දිනපතා අස්වැන්න නෙලිය යුතුය
- ප්‍රශස්ත පාලන හා පාරිසරික තත්ත්වයන් යටතේ දින 2-5 ක් තුළ පොකුණ තුළ ඇති ඇසොල්ලා ප්‍රමාණය දෙගුණ වේ. (ප්‍රශස්ත සෙවන, පොකුණු ජලයේ ඇති පෝෂක ප්‍රමාණය සහ උෂ්ණත්වය)

විද්‍යාත්මක පසුබිම:

මෙම ඇසොල්ලා පැළෑටිය ඇනබීනා ඇසොල්ලා නම් වූ නීල හරිත ඇල්ගේ වර්ගය සඳහා ධාරක පැළෑටියක් වශයෙන් ක්‍රියා කරයි. මෙම ඇනබීනා නම් වූ නීල හරිත ඇල්ගේ වර්ගය වායුගෝලීය නයිට්‍රජන් තිර කරමින් ඇසොල්ලා පැළෑටියේ පෝෂණ ගුණය වැඩි කිරීමට ක්‍රියා කරන අතර ඇසොල්ලා පැළෑටිය සමඟ සහජීවනයෙන් ජීවත් වේ.

නිෂ්පාදන වියදම ගණනය කිරීම:

මෙහිදී පහත සඳහන් උපකල්පනයන් යොදා ගන්නා ලදී.

- ඇසොල්ලා පොකුණ සකස් කර ගැනීමට සහ නඩත්තු කිරීමට ගොවි මහතා සිය ශ්‍රමය සහ පවුලේ ශ්‍රමය පමණක්ම යොදා ගනී.
- ගොවි මහතා සිය ගොවිපලෙන්ම ලබා ගන්නා ගොම සහ අනෙකුත් සම්පත් (සරු පස් සහ ජලය, ගඩොල් හෝ වෙනත් ගල්) මේ සඳහා යොදා ගනී.

මීටර් 2 x 1 x 0.3 විශාලත්වයෙන් යුත් ඇසොල්ලා පොකුණක් ඉදි කිරීමට සහ නඩත්තු කිරීමට අවශ්‍ය නිෂ්පාදන වියදම ගණනය (මාස 08 ක එක් නිෂ්පාදන චක්‍රයක් සඳහා)

- ඝනකම් පොලිතින් සඳහා පිරිවැය (දිග මීටර් 2.5) - රු. 200.00
- සුපර් ෆොස්ෆේට් ග්‍රෑ. 500 ක් සඳහා පිරිවැය - රු. 35.00
- පොලි නෙට් සඳහා පිරිවැය - රු. 135.00
- මුළු පිරිවැය - රු. 370.00

- මාස 08 කදී ඇසොල්ලා අස්වැන්න (ආසන්න වශයෙන්)	- කි.ග්‍රෑ. 240
- ඇසොල්ලා කි.ග්‍රෑ. 01 ක් නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය (ආසන්න වශයෙන්) පොලි දැල් සහිතව	- රු. 370/240 කි.ග්‍රෑ. - **කි.ග්‍රෑ. එකකට රු. 1.50**
- ඇසොල්ලා කි.ග්‍රෑ. 01 ක් නිෂ්පාදනය කිරීම සඳහා පිරිවැය (ආසන්න වශයෙන්) පොලි දැල් රහිතව	- රු. 235/240 කි.ග්‍රෑ. - **කි.ග්‍රෑ. එකකට රු. 1.00**

මෙම ගණනය කිරීම සිදුකර ඇත්තේ සම්මත ප්‍රමාණයේ ඇසොල්ලා පොකුණකින් දිනකට ඇසොල්ලා කි.ග්‍රෑම් 01 ක අස්වැන්නක් ලබාගත හැකි බවට උපකල්පනය කරමිනි.

එසේ වුවද, ඇසොල්ලා අස්වැන්න විවිධ පාංශු හා පරිසර සාධක මතත්, ඇසොල්ලා වගාව පිළිබඳ ගොවියා සතුව ඇති මනා නිපුණත්වය හා පුහුණුව මතත් දැඩි විචල්‍යතාවයක් (සම්මත ප්‍රමාණයේ පොකුණකින් දිනකට කි.ග්‍රෑම් 0.5-1.5 දක්වා) පෙන්වන බැවින්, මුලින් සිදු කළ උපකල්පනයන් යටතේ, ඇසොල්ලා කි.ග්‍රෑම් 01 ක සත්‍ය නිෂ්පාදන පිරිවැය රු. 1.00-2.00 දක්වා වෙනස්විය හැකිය (ප්‍රශස්ත පරිසර හා පාලන තත්ත්ව යටතේ).

වැදගත් තොරතුරු:

- පොල් වගාකර ඇති බිමක ඇසොල්ලා පොකුණු සැකසීම මඟින් ඇසොල්ලා වගාවට අවශ්‍ය සෙවන සැපයිය හැකිය. එසේ නැතහොත් කෙසෙල් හෝ ග්ලිරිසීඩියා වගාකිරීම මඟින් ද පොල් අතු හෝ වෙළඳපලෙන් මිලදී ගත හැකි සෙවන ලබාදෙන දැල් මඟින් ද වගාවට අවශ්‍ය සෙවන ලබාදිය හැකිය
- වෙනත් සත්ත්ව ආහාරවලට අමතරව කිරි ගවයන්ට, ඇසොල්ලා ලබාදීම මඟින් කිරි නිෂ්පාදනය වැඩිවන බවත්, බිත්තර නිෂ්පාදනය සඳහා ඇතිකරන කිකිළියන්ට ලබාදීමේදී බිත්තර නිෂ්පාදනය වැඩිවන බවත්, මස් සඳහා ඇතිකරන පක්ෂීන්ට ඇසොල්ලා ලබාදීමේදී, මස් නිෂ්පාදනය වැඩිවන බවත්, ඉන්දියාවේ සිදු කරන ලද පර්යේෂණ වලින් හෙළිවී ඇත. මීට අමතරව වෙනත් සත්ත්ව ආහාරවලට අමතරව ඇසොල්ලා ලබාදීම මඟින් සියලුම ගොවිපල සත්ත්ව වර්ගවල නිෂ්පාදනය වැඩිවන බව එම පර්යේෂණ මඟින් තව දුරටත් සනාථ කර ඇත.
- පශු පර්යේෂණ ආයතනය මඟින් ලංකාවේ සිදුකරන ලද කුඩා පරිමාණයේ ගොවිපල් සමීක්ෂණයක් මඟින් ද, වෙනත් සත්ත්ව ආහාරවලට අමතරව කිරි ගවයන්ට සහ කිකිළියන්ට ඇසොල්ලා ලබාදීම මඟින් කිරි සහ බිත්තර නිෂ්පාදනය වැඩිවන බවට ගොවීන් අත්දැකීම් ලබා ඇතිබව හෙළි කරගෙන ඇත.
- ඇසොල්ලා පොකුණුවල මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා එම පොකුණු තුළ ගප්පි මත්ස්‍යයන් ඇතිකිරීම කළ හැකිය. එම මත්ස්‍යයන් මදුරු කීටයන් මෙන්ම මදුරු බිත්තර ද කා දමයි.

- ඇසොල්ලා වගා කිරීම වියදම් අඩු වගා ක්‍රමයක් වුවද, සෑම පියවරකදීම ඉතාමත් අවධානයෙන් යුතුව කටයුතු කිරීම බෙහෙවින්ම වැදගත් වේ.
- ඇසොල්ලා පොකුණ පිළිබඳව දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන්නේ නම් ඔබට දෛනිකවම ඉතා හොඳ අස්වැන්නක් ලබාගත හැකි වන අතර එමඟින් ඔබගේ ගොවිපල සතුන්ගේ ආහාර සඳහා දැරීමට සිදුවන වියදම අඩු කරගත හැකි වන අතර සතුන්ට සපයන ආහාරවල ගුණාත්මය ද ඉහළ දැමිය හැකිවනු ඇත.
- ඇසොල්ලා වගා කිරීම පිළිබද තාක්ෂණික දැනුම අප සතුව ඇති අතර ගොවීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා ද අපි සූදානම්ව සිටින්නෙමු.

විශේෂ පණිවිඩය:

ඇසොල්ලා ගොවිපල සතුන් සඳහා ඉතා යෝග්‍ය අතිරේක ආහාරයකි. මෙය, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල කුඩා පරිමාණයේ සත්ත්ව පාලන කටයුතු වලදී විශේෂයෙන් එළ ගවයින් සහ කුකුළන් සඳහා නිෂ්පාදන වියදම අවම කර ගැනීම සඳහාත්, සත්ත්ව නිෂ්පාදන වලින් ඉහළ ආදායමක් ලබා ගැනීම සඳහාත් යොදාගත හැකි අගනා සත්ත්ව ආහාර වර්ගයක් වේ.

බීජ ඇසොල්ලා ලබා ගැනීමට සහ ඇසොල්ලා වගා කිරීම පිළිබඳව පුහුණුව ලබා ගත හැකි ස්ථානය

ගොවිපල් පද්ධති සහ ආර්ථික විද්‍යා අංශය,
පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය,
ගන්නෝරුව, පේරාදෙණිය.

රචනය

අයි.කේ. ලෙව්කේ බණ්ඩාර මිය

(පර්යේෂණ නිලධාරිණී)

පූර්ව පරීක්ෂණය

ආචාර්ය යූ.එල්.පී. මංගලිකා මිය

(නියෝජ්‍ය අධ්‍යක්ෂ - පර්යේෂණ)

ආචාර්ය ඩබ්ලිව්.එම්.පී.බී. වීරසිංහ මයා

(පශු පර්යේෂණ නිලධාරි)

විවිධ සහාය

ජේ.එම්. හොලින් මයා

(රසායනාගාර සහකාර)

පිටු සැකසුම හා පිටකවර නිර්මාණය

ඩබ්.පී. සඳමාලි කරුණාරත්න

නිර්මාණය

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය

ගන්නොරුව, පේරාදෙණිය

Designed by :
NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE,
Department of Agriculture